වාරය - ii

| ශ්‍රේණිය : 6 | විෂයය : පෙරදිග සංගීතය | පාඩම : ගීත රසාස්වාදය |
|---|---|---|

ක්‍රියාකාරකම : පාසල් ගීතය ගායනය

සෑම පාසලකටම පාසලේ අනන්‍යතාවය පිලිඹිබු කරන ගීතයක් පවතී . එම ගීතයෙන් පාසලේ ඓතිහාසික තොරතුරු ඔබට වටහා ගත හැක . සෑම පාසල් ගීතයකටම නිර්මාපකයෙක් සිටින අතර මෙය සාමූහිකව ගායනය කරනු ලබයි.

එහි පද මාලාව හා තනුව මනා සංයෝගයකින් යුතු වන අතර ගායනය කිරීමේදි සීරුවෙන් සිටිය යුතු වේ. ගායනයේදි හා ශ්‍රවණය කිරීමේදි සිසුන් තුළ දැඩි සංයමයක්, අභිමානයක් ,හා ප්‍රබෝධයක් තිබිය යුතුය .පාසල් ගීතය සහ පාසල් කොඩිය පාසලේ අනන්‍යතාවය පිලිඹිබු කරයි.

6 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ඔබ වැන්නෙකුට පාසල් ගීතය ආගන්තුක නොවන අතර මීට පෙර පාසලේ විවිධ උත්සව අවස්ථා වලදී ඔබ එය ගයා ඇත.

6 ශ්‍රේණියට නවක සිසු දරුවෙක් නම් ඔබ ඉගෙනුම ලබන පාසලේ පාසල් ගීතය සොයා ඉගෙන ගත යුතුව ඇත. කෙසේ වුවත් ඔබගේ දෙවන වාරයේ පළමු පාඩම පාසල් ගීතයයි.

ඔබ සංගීතය පොතේ පාසල් ගීතය සටහන් කර ගන්න

පසු අභ්‍යාස : පාසල් ගීතයේ ස්වර ප්‍රස්තාරය සොයා ගෙන සටහන් කර ගැනීමටත් එය ස්වර පුවරු වාද්‍ය භාණ්ඩයක ආධාරයෙන් වාදනය කිරීමටත් උත්සාහ ගන්න .